ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

පුවත්පත් නිව**ේදනය**

<u>**2026** ඉන්දියා-කෘත්‍රිම බුද්ධි බලපෑම් **(**India–AI Impact Summit**)** සමුළුව **ලෝක** නායකයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ</u>

**2026** ඉන්දියා-කෘත්‍රිම බුද්ධි බලපෑම් (India–AI Impact Summit) සමුළුව පෙබරවාරි **16-20** දක්වා නව දිල්ලි නුවරදී පැවැත්වේ**.** මෙම සමුළුව සූත්‍ර ත්‍රිත්වයක් එනම් ජනතාව**,** පෘථිවිය සහ ප්‍රගතිය යන **තේමාවන්** පදනම් කරගෙන පැවැත්වෙන අතර එතුළින් කෘත්‍රිම බුද්ධිය සඳහා **සහයෝගීතාවය** සම්බන්ධයෙන් ඉන්දියාවේ **ප්‍රවේශය** නිර්වචනය වේ**.** මෙම සමුළුව කෘත්‍රිම බුද්ධි **ක්ෂේත්‍රයේ** ඉදිරි ගමන්මග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා **ලොව** පුරා **ගෝලීය** නායකයන්**,** ප්‍රතිපත්ති සම්පාදකයන්**,** **නවෝත්පාදකයන්** සහ ප්‍රවීණයන් එකට එක් කරනු **ඇත.**

2. අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ආරාධනය අනුව පහත සඳහන් රටවල නායකයන් කෘත්‍රිම බුද්ධි බලපෑම් සමුළුව සඳහා සහභාගී වීමට නියමිතය:

1. භූතානය - අතිගරු ෂෙරින්ග් ටොබ්ගේ මැතිතුමා, අග්‍රාමාත්‍ය
2. බොලිවියාව - අතිගරු එඩ්මන්ඩ් ලාරා මොන්ටානෝ මැතිතුමා, උප ජනාධිපති
3. බ්‍රසීලය - අතිගරු ලුවිස් ඉනාසියෝ ලුලා ද සිල්වා මැතිතුමා, ජනාධිපති
4. ක්‍රොයේෂියාව - අතිගරු ඇන්ඩ්‍රෙ ප්ලෙන්කොවිච් මැතිතුමා, අග්‍රාමාත්‍ය
5. එස්තෝනියාව - අතිගරු ඇලර් කාරිස් මැතිතුමා, ජනාධිපති
6. ෆින්ලන්තය - අතිගරු පෙටේරි ඕර්පෝ මැතිතුමා, අග්‍රාමාත්‍ය
7. ප්‍රංශය - අතිගරු ඉමැනුවෙල් මැක්‍රොන් මැතිතුමා, ජනාධිපති
8. ග්‍රීසිය - අතිගරු කිරියාකොස් මිට්සොටාකිස් මැතිතුමා, අග්‍රාමාත්‍ය
9. ගයනාව - අතිගරු ආචාර්ය භාරත් ජග්දියෝ මැතිතුමා, උප ජනාධිපති
10. කසකස්ථානය - අතිගරු ඕල්ෂාස් බෙක්ටෙනොව් මැතිතුමා, අග්‍රාමාත්‍ය
11. ලිච්ටෙන්ස්ටයින් - ලිච්ටෙන්ස්ටයින් හි ඔටුන්න හිමි අතිගරු ඇලොයිස් කුමරු
12. මොරිෂස් රාජ්‍යය - අතිගරු වෛද්‍ය නවින්චන්ද්‍ර රාම්ගුලාම් මැතිතුමා, GCSK, FRCP, අග්‍රාමාත්‍ය
13. සර්බියාව - අතිගරු ඇලෙක්සැන්ඩර් වුචිච් මැතිතුමා, ජනාධිපති
14. ස්ලෝවැකියාව - අතිගරු පීටර් පිලිග්‍රිනි මැතිතුමා, ජනාධිපති
15. ස්පාඤ්ඤය - අතිගරු පේද්‍රො සැන්චෙස් පේරේස් කස්ටෙහොන් මැතිතුමා, ජනාධිපති

16. ශ්‍රී ලංකාව - අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා, ජනාධිපති
17. සීෂෙල්ස් - අතිගරු සබෙස්ටියන් පිල්ලේ මැතිතුමා, උප ජනාධිපති
18. ස්විට්සර්ලන්තය - ගී පර්මෙලින් මැතිතුමා, ජනාධිපති
19. නෙදර්ලන්තය - අතිගරු ඩික් ස්කූෆ් මැතිතුමා, අග්‍රාමාත්‍ය
20. එක්සත් අරාබි එමීර් රාජ්‍යය - අබුඩාබියේ ඔටුන්න හිමි ෂෙයික් ඛාලඩ් බින් මොහොමඩ් බින් සයිද් අල් නාහ්යන් කුමරු

3. මෙයට අමතරව රටවල් 45කට අධික ප්‍රමාණයකින් අමාත්‍ය මණ්ඩල නියෝජිතයන් ද සමුළුව සඳහා සහභාගී වනු ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමා සහ විවිධ ජාත්‍යන්තර සංවිධානවල ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් රැසක් ද මෙම සමුළුව සඳහා සහභාගී වීමට නියමිතය.

****

**කොළඹ**
***2026* පෙබරවාරි *14***

මූලාශ්‍රය:
https://www.mea.gov.in/press-releases.htm?dtl/40773/World_Leaders_at_the_IndiaAI_Impact_Summit_20269